A3 - 4 A4 - 1

# ඩී.එස්.සේනානායක විද්‍යාලය

## තුන්වන වාර පරීක්ෂණය - 2016 ජූලි

## 12 ශ්‍රේණිය

**සාමාන්‍ය තොරතුරු තාක්ෂණය I**

කාලය පැය 1යි

- සියලුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.
- 1-40 තෙක් දී ඇති 1, 2, 3, 4 පිළිතුරුවලින් නිවැරදි පිළිතුර තෝරන්න.

1. 70 ද්විමය ආකාරයෙන්
(1) $1000011_2$ (2) $10000100_2$ (3) $1000101_2$ (4) $1000110_2$

2. 2013 වර්ෂය ද්විමය ආකාරයෙන් පරිගණකයේ ප්‍රධාන මතකය තුළ ගබඩා වන්නේ
(1) $11110111101_2$ (2) $11111001101_2$ (3) $11111111111_2$ (4) $11111011100_2$

3. තුන්වන පරම්පරාවේ පරිගණක පදනම වන්නේ කුමක්ද ?
(1) රික්තක බට
(2) ට්‍රාන්සිස්ටර
(3) අනුකලිත පරිපථ
(4) ඉතා විශාල ප්‍රමාණයේ අනුකලිත පරිපථ

4. මධ්‍ය සැකසුම් ඒකකය (Central Processing Unit)සමන්විත වන්නේ
(1) ගණිත හා තර්ක ඒකකය සහ පාලන ඒකකයෙනි.
(2) ගණිත හා තර්ක ඒකකය සහ ආදාන ඒකකයෙනි.
(3) ආදාන ඒකකය හා ප්‍රතිදාන ඒකකයෙනි.
(4) පාලන ඒකකය සහ ආදාන ඒකකයෙනි.

5. පහත පරිගණක උපාංග පිළිබඳව සලකා බලන්න.
A - යතුරු පුවරුව
B - සුපරීක්ෂකය
C- මුද්‍රණ යන්ත්‍රය
D - ස්පීකර්
පරිගණකයේ ආදාන උපාංගයක් වන්නේ,
(1)A හා B
(2)A හා C
(3)C හා D
(4)A ,B, C හා D


6. දශම සංඛ්‍යා වලට පරිවර්තනය කළ විට පිළිවෙලින් ඔත්තේ හා ඉරට්ටේ සංඛ්‍යා යුගලයක් නිරූපණය වන්නේ පහත දැක්වෙන කුමන ද්විමය සංඛ්‍යා යුගලයෙන්ද?
(1) $0101_2$ , $0011_2$ (2) $0010_2$ , $1000_2$ (3) $0111_2$ , $0001_2$ (4) $0111_2$ , $0110_2$

7. ගිගා බයිටයක් (1GB) ආසන්න ලෙස තුල්‍ය වන්නේ,
(1) 10KB (2) $10^2$KB (3) $10^3$KB (4) $10^3$MB

8. නිරතුරුව දත්ත ඇතුළත් කිරීමේ යෙදෙන දත්ත සටහන් ක්‍රියාකරුවෙකුට වඩාත් ම සුදුසු පකරණය වන්නේ
(1) අත්ලමත පරිගණකය(Palmtop Computer)
(2) උකුල මත පරිගණකය(Laptop Computer)
(3) මේස පරිගණකය(Desktop Computer)
(4) ස්පර්ෂ තිරය (Touch Screen)


9. එක්තරා පියෙකුගේ වයස තම දියණියගේ හා තම පුතුගේ වයස් වල එකතුවට සමාන වේ.දියණියගේ සහ පුතාගේ වයස ද්විමය ආකාරයෙන් පිළිවෙලින් අවුරුදු 11110 හා 11011 වේ නම් පියාගේ වයස දශමය ආකාරයෙන් කීයද?
(1) 55 (2) 57 (3) 59 (4) 62

10. ප්‍රතිදානය 0 වීම සඳහා A සහ B ආදානවලට පිළිවෙලින් ලබා දිය යුතු අගය සොයන්න.




(1) 0 සහ 1 (2) 1 සහ 1 (3) 1 සහ 0 (4) 0 සහ 0

11. එක්තරා තර්කණ ද්වාරයකට අදාල පරිපතය පහත වේ.




A – X ස්විචය වසා (ON)ඇති විට බල්බය දැල්වේ
B – X හා Y ස්විච දෙකම වසා (ON)ඇති විට බල්බය දැල්වේ.
C – X ස්විචය විවෘතව (OFF)ඇති විට හා Y වසා ඇති (ON) විට බල්බය දැල්වේ.

(1) A හා B පමණි
(2) B හා C පමණි
(3) A හා C පමණි
(4) A , B හා C සියල්ලම.

12. දී ඇති සත්‍යතා වගුවම අදාළ තර්කන මෙහෙයුම තෝරන්න.

(1) X AND Y
(2) NOT (X AND Y)
(3) X OR Y
(4) NOT (X OR Y)

| ආදානය X | ආදානය Y | ප්‍රතිදානය |
|---|---|---|
| 0 | 0 | 1 |
| 0 | 1 | 1 |
| 1 | 0 | 1 |
| 1 | 1 | 0 |

The National e-learning Portal for The General Education

13. රට පුරා විසිරී ඇති බැංකු ශාඛා ගණනාවක් එකිනෙක සම්බන්ධ කිරීම සඳහා පහත දැක්වෙන පරිගණක ජාල වර්ග අතුරෙන් යොදාගත හැක්කේ කවරක්/ කවර ඒවාද?

a. ස්ථානීය පෙදෙස් ජාල Local Area Network)
b. පුළුල් පෙදෙස් ජාල( Wide Area Network)
c. පුරවර පෙදෙස් ජාල(Metropolitan Area Network)

(1) a පමණි (2) b පමණි (3) c පමණි (4) b හා c පමණි

14. පරිගණයක් ස්ථානීය පෙදෙස් ජාලයකට සම්බන්ද නිරීමේදී වඩාත් ප්‍රයෝජනවත් වන්නේ පහත දැක්වෙන කවර සංරචකයද?

(1) රවුටරය
(2) පරිගණක තිරය
(3) ජාලකරණ අතුරු මුහුණත් කාඩ්පත
(4) මොඩමය

15. අන්තර්ජාලය හා ලෝක විසිරි වියමන (World Wide Web) සම්බන්ධයෙන් වඩාත්ම ගැළපෙන ප්‍රකාශය හඳුනාගන්න.

(1) අන්තර්ජාලය හා ලෝක විසිරි වියමන යනු එකක්ම වේ.
(2) ලෝක විසිරි වියමන යනු අන්තර්ජාලයෙහි සේවාවකි.
(3) අන්තර්ජාලය යනු ලෝක විසිරි වියමනෙහි සේවාවකි.
(4) අන්තර්ජාලය හා ලෝක විසිරි වියමන අතර සම්බන්ධතාවක් නැත.

16. දත්ත සන්නිවේදනය සඳහා භාවිතා වන මාධ්‍ය සම්බන්ධයෙන් සත්‍ය වන්නේ පහත දැක්වෙන කවර ප්‍රකාශය/ ප්‍රකාශයද ?

a. තඹ රැහැන් වලට ප්‍රකාශ තන්තු රැහැන් (Fiber optic cables) වැඩි තැන්මාරු (transfer) ශීඝ්‍රතාවයක් සපයයි.

b. ප්‍රකාශ තන්තු රැහැන් වලට වඩා තඹ රැහැන් වැඩි තැන්මාරු ශීඝ්‍රතාවක් සපයයි.

c. තඹ රැහැන්, ප්‍රකාශ තන්තු රැහැන් වලට වඩා මිල අධිකය.

(1) a පමණි. (2) a හා c පමණි. (3) b පමණි. (4) b හා c පමණි.

17. පහත සඳහන් ඒවා අතුරෙන් මෙහෙයුම් පද්ධතියක මූලික ලක්ෂණයක් වන්නේ කුමක්ද ?

(1) වයිරස සුපිරික්සීම.(Virus scanning)
(2) ගොනු කළමණාකරණය.(File management)
(3) දත්ත පාදක නිර්මාණය කිරීම.(Creating database)
(4) වියමන සෙවීම.(Web searching)

18. විවෘත හා නිදහස් මෘදුකාංගයක් ලෙස හැඳින්වෙන්නේ පහත කුමන මෙහෙයුම් පද්ධතියද?

(1) DOS (2)Ubuntu (3)Windows XP (4)Mac OS

19. දෘඩ තැටියක් (Hard disk) හැඩසවි ගැන්වීම (Formatting)

(1) වියමන් අතරික්සුවක (Web browser) කාර්යයකි.
(2) මෙහෙයුම් පද්ධතියක(Operating system) කාර්යයකි.
(3) වදන් සැකසුමක(Word processing) කාර්යයකි.
(4) වයිරස් සුපරික්සකයක(Virus scanner) කාර්යයකි.

20. මතක ධාරිතාව අඩු උපාංගයේ සිට වැඩි උපාංගය දක්වා පිළිවෙලින් ඇති පිළිතුර වන්නේ,

(1) Floppy disk, CD ROM, DVD ROM, Hard disk
(2) DVD ROM, Floppy disk, CD ROM , Hard disk
(3) Hard disk , Floppy disk, CD ROM, DVD ROM
(4) DVD ROM, CD ROM, Floppy disk, Hard disk

21. මෘදුකාංග නිවැරදිව වර්ගීකරණය කර ඇත්තේ,

(1) මෙහෙයුම් පද්ධති සහ සම්පාදක මෘදුකාංග
(2) පද්ධති මෘදුකාංග සහ යෙදවුම් මෘදුකාංග
(3) සැකසූ හා විශේෂ කාර්යන් සඳහා සැකසූ මෘදුකාංග
(4) පද්ධති මෘදුකාංග හා උපයෝගිතා මෘදුකාංග

22. නිවැරදි විද්‍යුත් තැපැල් ලිපිනයන් වන්නේ,

(1) www.teena.com (2) malith.yahoo.com
(3) ge, eth@yahoo.com (4) weena@yahoo.com

23. C:\users\grade12\git යන්නෙහි මූල නාමාවලිය (root directory) කුමක්ද?

(1) Users (2) grade12 (3) git (4) C:\

24. පරිගණක වෛරසයක් යනු,

(1) Hackers ය.
(2) Program ගොනුවේ.
(3) භෞතික දෙයකි.
(4) පරිගණකයට හානි කරන දෙයක් නොවේ.

25. හිස කැක්කුම සහ ඇස්වල වෙනස ඇති වීමට පහත කවරක් හේතු විය හැකිද?

(1) වියළි ඇස්
(2) දූවිල් සහිත හෝ බොඳ වූ පරිගණක තිරය.
(3) විරාමයක් රහිතව දිගු වේලාවක් පරිගණක තිරය දෙස බලා සිටීම.
(4) ඉහත සියල්ලම.

26. පරිගණක ජාල වින්‍යාසයකට (Network Topology)උදාහරණයක් නොවන්නේ.

(1) තරුව (Star) (2) කැදැල්ල (Nest) (3) මුදුව (Ring) (4) බසය (Bus)

27. GPS යනුවෙන් කුමක් අදහස් වේද ?
(1) Global Pointing System
(2) General Positioning System
(3) Global Positioning System
(4) Graphical Pointing System

28. පහත දක්වා ඇති දෑ අතුරින් ජාල සංනිවේදන උපක්‍රම වන්නේ මොනවාද?
(1) ජාල අතුරු මුහුණත් පත, ස්ථානීය පෙදෙස් ජාලය
(2) රවුටරය,පුළුල් පෙදෙස් ජාලය
(3) ස්විචය, රවුටරය
(4) ජාල අතුරු මුහුණත් පත, පුළුල් පෙදෙස් ජාලය

29. වයි-ෆයි තාක්ෂණය ඔස්සේ දත්ත සම්ප්‍රේෂණය වන්නේ
(1) ආලෝක තන්තු (2) රේඩියෝ (3) අධෝරක්ත (4) ක්ෂුද්‍ර තරංග

30. රූපවාහිනී විකාශය .................... සන්නිවේදනයට උදාහරණයක් ලෙස සැලකිය හැක.
(1) ඒකපථ(Simplex) (2) ඍජු ලක්ෂය(Point to Point)
(3) පූර්ණ ද්විපථ(Full duplex) (4) අර්ධ ද්විපථ(Half duplex)

31. විද්‍යුත් තැපැල් (e-mail) යැවීමට අත්‍යවශ්‍ය අවශ්‍යතාවයක් නොවන්නේ පහත සඳහන් කුමක්ද?
(1) පරිගණකයක් වැනි උපාංගයක්
(2) ලබන්නාගේ විද්‍යුත් තැපැල් ලිපිනය
(3) අන්තර්ජාල සම්බන්ධතාවයක්
(4) යවන්නාගේ අත්සන

32. *Ctrl + F* යන කෙටි මං යතුර වදන් සැකසුම් මෘදුකාංගයකදී භාවිතවන්නේ .......................... සඳහා ය.
(1) නිශ්චිත පාඨ ප්‍රතිස්ථාපනය කිරීම
(2) හැඩසවි (formatting) මෙවලම් තීරුව ක්‍රියාත්මක කිරීමට.
(3) නිශ්චිත පාඨ සෙවීමට
(4) ලේඛනය සුරැකීම

33. වදන් සැකසනයක ඇති ¶ නිරූපකය භාවිතයෙන් පහත කුමන කාර්ය කරගත හැකිද?
(1) ඡේදයක අනුඡේද මට්ටම (indent level) වැඩිකර ගැනීම.
(2) ලේඛනයක ඇති සියලුම හැඩසවි ගැන්වීම් (formatting) ඉවත් කිරීම.
(3) මුද්‍රණය නොවන අනුලක්ෂණ දැක ගැනීම.
(4) පිටු පෙළ ගැස්වීමේ මෙනුව (setup menu) දැක ගැනීම.

34. කදා දැක්ම (slide show) අතරමැද දී පෙර කදාව වෙත පිවිසීමට භාවිත කළ යුතු යතුර වන්නේ පහත ඒවායින් කුමක්ද?
(1) P (2) B (3) W (4) N

35. පැතුරුම්පත් මෘදුකාංගයක භාවිතවන කෝෂ ලිපින (cell address) නිවැරදි ආකාරයෙන් දක්වා ඇත්තේ පහත ඒවායින් කවරක්ද?
A – C$5
B - $C5
C – C5$
(1) A හා B (3) A හා C
(2) B හා C (4) A , B හා C සියල්ලම

36. A8 කෝෂයෙහි =Rank(A5, A1:B7) සූත්‍රය අඩංගුව ඇත්නම් එම කෝෂයේ දැක්වෙන අගය කුමක්ද?
(1) 1
(2) 2
(3) 3
(4) 4

| | A | B |
|---|---|---|
| 1 | 1 | |
| 2 | | 2 |
| 3 | 3 | |
| 4 | | 4 |
| 5 | 5 | |
| 6 | | |
| 7 | 7 | 6 |
| 8 | | |

| | A | B | C |
|---|---|---|---|
| 1 | 1 | 2 | 3 |
| 2 | 2 | 3 | 4 |
| 3 | 2 | | |
| 4 | | | |

37. B3 කෝෂයෙහි පහත සඳහන් අඩංගුයැයි සලකන්න.
=A$1*B2
මෙම සූත්‍රය C3 කෝෂයට කොපි කළ හොත් C3 කෝෂයෙහි දිස්වෙන අගය කුමක් විය හැකිද?
(1) 2
(2) 3
(3) 4
(4) 5

38. පුස්තකාල තොරතුරු පද්ධතියක දත්ත සමුදා වගුවක කොටසක් පහත වේ.

| BookID | AuthorID | ISBNNumbe | Publisher |
|---|---|---|---|
| 11111 | 4367 | 1113456789 | XYZ |
| 11123 | 3354 | 1234567785 | PKR |
| 11134 | 4432 | 1444567456 | XYZ |

ඉහත වගුවේ පිළිවෙලින් කොපමණ ක්ෂේත්‍ර හා රෙකෝඩ සංඛ්‍යාවක් අඩංගු වන්නේද?
(1) 2 , 3
(2) 3 , 4
(3) 4 , 3
(4) 4 , 4

39. පරිගණක භාෂාවක් නොවන්නේ,
(1) Pascal
(2) Java
(3) Oracal
(4) VB

40. ආංකික බෙදුම (Digital Divide) ලෙස හඳුන්වන්නේ කුමක්ද?
(1) ආංකික බෙදුම යනු තොරතුරුවල අවශ්‍යතාවය එක් එක් ප්‍රදේශවලට බෙදීම.
(2) ආංකික බෙදුම යනු ආංකික දත්ත කුඩා කොටස්වලට බෙදීමයි.
(3) ආංකික බෙදුම යනු ආංකික සංඥා ශ්‍රව්‍ය , දෘශ්‍ය හා පාඨ ලෙස කොටස්වලට බෙදීමයිග
(4) ආංකික බෙදුම යනු මහජනයා පරිගණක සාක්ෂරතාව සහිත සහ පරිගණක සාක්ෂරතාව රහිත ලෙස වර්ග 2කට බෙදීමයි.

# ඩී.එස්.සේනානායක විද්‍යාලය

## තුන්වන වාර පරීක්ෂණය - 2016 ජූලි

12 ශ්‍රේණිය

**සාමාන්‍ය තොරතුරු තාක්ෂණය II**

කාලය පැය 2යි

ප්‍රශ්න හතරකට පමණක් පිළිතුරු සපයන්න.

(01) (a)( i) පහත දැක්වෙන වගුව පිළිතුරු පත්‍රයේ පිටපත් කරගෙන 3, 4, 5 තීරු සම්පූර්ණ කරන්න.


| 1 | 2 | 3 | 4 | 5 |
|---|---|---|---|---|
| X | Y | P= NOT (X OR Y) | Q= X AND Y | R= P OR Q |
| 0 | 0 | | | |
| 0 | 1 | | | |
| 1 | 0 | | | |
| 1 | 1 | | | |

(ii) X , Y ආදාන ලෙස හා R ප්‍රතිදානය ලෙස ගෙන ඉහත සත්‍යතා වගුවට අදාල පරිපථය ( logic circuit ) ගොඩනගන්න.

(iii) පහත දැක්වෙන වගුව පිළිතුරු පත්‍රයේ පිටපත් කරගෙන හිස්තැන් සම්පූර්ණ කරන්න.

| Inputs | | | output |
|---|---|---|---|
| A | B | C | (A AND B) AND (NOT C) |
| 1 | 1 | 1 | ? |
| 1 | 1 | 0 | ? |
| 1 | 0 | 1 | 0 |
| 1 | 0 | 0 | 0 |
| 0 | 1 | 1 | 0 |
| 0 | 1 | 0 | ? |
| 0 | 0 | 1 | ? |
| 0 | 0 | 0 | 0 |

(iv) පහත දැක්වෙන පරිපථයට අදාල බූලීය ප්‍රකාශනය ලියන්න.



(4) පහත දැක්වෙන පැතුරුම්පත ඇසුරින් අසා ඇති ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

| | A | B | C | D | E | F | G |
|---|---|---|---|---|---|---|---|
| 1 | | | | ABC Company | | | |
| 2 | Item | unit price | unit price delivery charges per unit | number of items sold for month | monthly item income | monthly delivery income | total monthly income |
| 3 | computer | Rs. 75,000.00 | Rs. 250.00 | 90 | Rs. 6,750,000.00 | Rs. 22,500.00 | Rs. 6,772,500.00 |
| 4 | scanner | Rs. 7,500.00 | Rs. 100.00 | 100 | Rs. 750,000.00 | Rs. 10,000.00 | Rs. 760,000.00 |
| 5 | printer | Rs. 20,000.00 | Rs. 150.00 | 150 | Rs. 3,000,000.00 | Rs. 22,500.00 | Rs. 3,022,500.00 |
| 6 | monitor | Rs. 15,000.00 | Rs. 200.00 | 75 | Rs. 1,125,000.00 | Rs. 15,000.00 | Rs. 1,140,000.00 |
| 7 | projector | Rs. 95,000.00 | Rs. 250.00 | 50 | Rs. 4,750,000.00 | Rs. 12,500.00 | Rs. 4,762,500.00 |
| 8 | | | | Grand Monthly Income | | | |

ABC සමාගම පරිගණක උපාංග බෙදාහරින ව්‍යාපාරයක් පවත්වාගෙන යයි. සියලු අයිතම සඳහා ප්‍රවාහන වියදම් C තීරුවෙන් දැක්වේ.

i. පරිගණක අලෙවියේ මාසික ආදායම සෙවීමට E3 කෝෂයේ ලිවිය යුතු සූත්‍රය ලියන්න.

ii. බෙදාහැරීමේ ආදායම සෙවීමට F3 කෝෂයේ ලිවිය යුතු සූත්‍රය ලියන්න.

iii. පරිගණක අලෙවියේ මාසික ආදායම සෙවීමට G3 කෝෂයේ ලිවිය යුතු සූත්‍රය ලියන්න.

iv. පරිගණක අලෙවියේ මුළු මාසික ආදායම සහ බෙදාහැරීමේ ආදායම සෙවීමට G8 කෝෂයේ ලිවිය යුතු සූත්‍රය ලියන්න.

v. D5 කෝෂයේ ඇති විකුණූ මුද්‍රක ( printers ) ප්‍රමාණය 150, 100 ලෙස වෙනස් කලේ නම්, එම නිසා යාවත්කාලීන ( updated.) වන කෝෂයන් මොනවාද?

> මාසික ආදායම = unit price x number of item sold
>
> බෙදාහැරීමේ ආදායම = Delivery charges per unit x number of item

(B) සමර්පණ (presentation) මෘදුකාංගයක් භාවිතයෙන් කදා 5 කින් යුත් ප්‍රදර්ශකයක් සෑදීමට සිදුව ඇත.

i. සමර්පණ මෘදුකාංගයක ඇති දසුන් (view) කවරේද?

ii. මෙම කදා පහසුවෙන් යලි පෙලගැස්වීමට(rearrange) වඩාත්ම සුදුසු දසුන (view) කුමක්ද?

iii. දෙන ලද සැලැස්මක් (design) මෙම කදා පහටම ආදේශ කිරීමට අවශ්‍ය පියවර ලියන්න.

5) i) ඔබ දන්නා ජාල ආකාර ( types of network ) 3ක් සඳහන් කරන්න.

ii) ජාල ස්ථල (network topology) 3ක් නම්කර ඇඳ දක්වන්න.

iii) අන්තර්ජාලය යන්න අර්ථ දක්වන්න.

iv) අන්තර්ජාල භාවිතයේ වාසි 3ක් සඳහන් කරන්න.


v) පහත වෙබ් ලිපිනයෙහි දක්වා ඇති X, Y,Z කොටස් නම් කරන්න.

http://www.nie.lk/syllabus.html

X (http://) Y (nie.lk/) Z (syllabus.html)

vi) http යන්නෙන් අදහස් වන්නේ කුමක්ද?

(2) පහත දැක්වෙන රූප සටහන ඇසුරෙන් අසා ඇති ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.




(A) (i) A , B , C සහ D සඳහා සුදුසු නාමයන් පහත දැක්වෙන ලැයිස්තුවෙන් තෝරා ලියන්න.

(යෙදුම් මෘදුකාංග, පරිශීලක, දෘඩාංග, පද්ධති මෘදුකාංග)


(ii) B හා C සඳහා උදාහරණ 2 බැගින් ලියන්න.

(iii) B ලෙස නම් කර ඇති මෘදුකාංග වර්ගයෙහි ඇති වැදගත්කම සඳහන් කරන්න.

(B) (i) පරිගණක වල භාවිත වන අතුරු මුහුණත් වර්ග 2 සඳහන් කර ඒ සඳහා උදාහරණය බැගින් සපයන්න.

(ii) උපයෝගිතා මෘදුකාංග සඳහා උදාහරණ 2 ක් ලියන්න.

(3) වදන් සැකසුම් මෘදුකාංගයක් ඇසුරෙන් සකසා ඇති පහත රූපසටහන භාවිතයෙන් පිළිතුරු සපයන්න.




(i) A ලෙස නම් කර ඇති මාතෘකාව ලබාගැනීමට යොදාගෙන ඇති මෙවලම කුමක්ද?

(ii) B ලෙස නම් කර ඇති බෝඩරය ලබාගැනීමට අනුගමනය කල පියවර ලියන්න.

(iii) C ලෙස නම් කර ඇති ඡේදය ලබාගැනීමට යොදාගෙන ඇති මෙවලම කුමක්ද?

(iv) D ලෙස නම් කර ඇති වචනය ලබාගැනීමට යොදාගෙන ඇති හැඩසවි (format) කිරීම කුමක්ද?


(v) E ලයිස්තුව ලබාගැනීමට අනුගමනය කල පියවර ලියන්න.

(vi) F ලෙස දැක්වෙන අධිසම්බන්ධයෙහි (hyperlink) වැදගත්කම ලියන්න.


(B) i) තොරතුරු සන්නිවේදන තාක්ෂණයේ අවාසි දෙකක් සඳහන් කරන්න.

ii) ඔබගේ පරිගණකයට වෛරස ඇතුළු වූ විට විය හැකි දේවල් 3ක් සඳහන් කරන්න.

6) A) ගැලීම් සටහනක දැක්වෙන පහත සංකේත වල අදහස ලියන්න.




B) 1 සිට 5 දක්වා ඇති ඉලක්කම්වල එකතුව සෙවීමට පහත ගැලීම් සටහන භාවිතා කරයි.




i) ගැලීම් සටහනේ ඇති ඉංග්‍රීසි අකුරට අදාල හිස්තැන පුරවන්න.

A ……
B…….
C…….
D…….
E……..

ii) මෙම ගැලීම් සටහනට අදාල ප්‍රතිදානය කුමක්ද?

iii) මෙම ගැලීම් සටහනෙහි ඇති පාලන ක්‍රම ( control structures ) මොනවාද?

iv) පහත සඳහන් ඒවාට උදාහරණ ලියන්න.

(A)ප්‍රකාශන (B)තර්ක